# ඉඩම් අමාත්‍යාංශය

## 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂයට මෙම අමාත්‍යාංශයට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

01. අයදුම්පත්‍ර බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021" යනුවෙන් සඳහන් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් 2021.03.24 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. එක් එක් අයිතමයන් සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර රු.500.00 ක ලියාපදිංචි ගාස්තුවක් ඉඩම් අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවීමෙන් පසු අදාල අයදුම් පත්‍රය 2021.03.23 දින තෙක් සතියේ දින වල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා ඉඩම් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබා ගත හැකිය.

| අනු අංකය | සැපයුම් අයිතමය |
|---|---|
| 1 | ටයර් සහ ටියුබ් සැපයීම |
| 2 | වාහන බැටරි සැපයීම |
| 3 | වාහන අලුත් වැඩියා කිරීම |
| 4 | වාහන කුෂන් අලුත් වැඩියාව |
| 5 | වාහන විදුලි අලුත් වැඩියාව |
| 6 | වාහන වායු සමීකරණ පද්ධති අලුත් වැඩියාව |
| 7 | වාහන සේවා කිරීම |
| 8 | පරිගණක හා උපාංග, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියාව |

කොන්දේසි

01. ආයතනයට අදාළ ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ හා වැට් බදු සඳහා ලියාපදිංචි වී ඇත්නම් එම සහතිකයේ පිටපත්ද අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතුය. එම ලේඛන 2021 වර්ෂයට වලංගුව තිබිය යුතුය.
02. ඉල්ලුම් කළවිට අඛණ්ඩව තෙවරක් මිල ගණන් ඉදිරිපත් නොකරන හා ඇණවුම් කළවිට නියමිත පරිදි භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන් ලියාපදිංචි ලේඛණයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
03. ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් අවශ්‍ය පරිදි මිල ගණන් කැඳවනු ලබන අතර, ප්‍රමාණවත් සැපයුම්කරුවන් නොමැති අවස්ථා වලදී අවශ්‍යතාවය මත බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවා මිලදී ගැනීම් හා සේවා ලබා ගැනීම සම්බන්ධ අයිතිය ඉඩම් අමාත්‍යාංශය සතු වේ.

වැඩි විස්තර දුරකතන අංක 011 2797524 / 011 2797523 මගින් ගිණුම් අංශය හෝ 011-2797543 මගින් ප්‍රවාහන අංශය අමතා ලබා ගත හැකිය

ලේකම්
ඉඩම් අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
ඉඩම් මහලේකම් කාර්යාලය,
නො.1200/6,රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.